**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව - 2020**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු රු.2,836,252ක වැටුප් ප්‍රතිපූර්ණ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් අදාළ නිවැරදි කිරීම් සිදු කරන බව දන්වමි. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 7,071,168 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) ඡේදය | ඉඩම් වෙන්දේසියේ විකිණීමෙන් ලත් මුදලින් සියයට 01 කට සමාන බද්දක් අයකර ගත යුතු වුවත්, | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඔප්පු ලියාපදිංචි කිරීම අවසන් වී නොමැති | තථ්‍ය විකුණුම් වටිනාකම තහවුරු කරගෙන ඉතිරි බදු මුදල් කඩිනමින් අය |

| | | | |
|---|---|---|---|
| | වෙන්දේසිකරු විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් මත පදනම්ව එම බදු මුදල අයකර තිබූ නමුත් විකුණූ ඉඩම්වලට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි ඔප්පු මඟින් තථ්‍ය විකුණුම් වටිනාකම තහවුරු කරගෙන බදු මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අතර, එය අවසානයෙන් පසු අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. ලියාපදිංචි කර ඇති ඉඩම් 08 ක වාර්තා ලබාගෙන ඇති අතර, ඒවාට අදාල මුදල් අයකර ගෙන ඇත. | කරවා ගත යුතුවේ. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) ඡේදය</u> | 2020 දෙසැම්බර් 31 දිනට රු.5,484,460 ක් වූ තැන්පතු ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම හේතුවෙන් කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි වී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට අදාලව තැන්පතු ශේෂ සඳහා කාල විශ්ලේෂණයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාල විශ්ලේෂණ සකස් කර ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,025,573ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,817,939ක් විය. පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ ආදායම් ආධාර රු.6,995,790.65 ක් වැඩි වීම පුනරාවර්කන වියදම ඉක්ම වූ ආදායමට වැඩිවීමට හේතු වී ඇත.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) <u>වරිපනම් බදු</u>** | | |
| (a) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.12,683,132ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමේ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි. තව ද වරිපනම් බද්දට යටත් සීමාවේ පිහිටි සංචාරක මණ්ඩලයේ | ගත යුතු ක්‍රියා මාර්ග සිදු කරමින් පවතින අතර හැකි ඉක්මනින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. | සියළුම හිඟ වරිපනම් හා බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| ලියාපදිංචි හෝටලයක්ද ඇතුලුව හෝටල් 03ක් සඳහා වරිපනම් ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | |

**(ආ)** අක්කර බදු

------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් හිමිකරුවන් 89දෙනෙකුට අදාළව අක්කර 1036කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් සඳහා අක්කර බදු අයකර ගෙන නොතිබුණු අතර ඉන් ඇතැම් ඉඩම්වල ප්‍රමාණයන් කොපමණද යන්න නිශ්චය කරගෙන නොතිබුණි. | මේ වන විට රු.15,838 ක මුදලක් ලැබී ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගන්නා අතර සනාථ කර නොගත් දේපළවල තොරතුරු සමීක්ෂණයක් මගින් සොයා ගැනීමට කටයුතු කරමි. | ඉඩම් ප්‍රමාණය නිවැරදිව නිශ්චය කර කඩිනමින් බදු අය කර ගත යුතුවේ. |

**(ඇ)** බලපත්‍ර ගාස්තු

----------------

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයද ඇතුළුව හෝටල් 03ක ක්‍රියාත්මක රටබීම විකුණුම්, පංචකර්ම සේවා, පිහිනුම් තටාක සේවා වැනි වෙනත් ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන ඒ සඳහා වෙළඳ බලපත්‍ර ආදායම් රැස්කර ගැනීමට විධිවිධාන සලසා ගෙන නොතිබුණි. එමෙන්ම පනතේ විධි විධාන ප්‍රකාරව පෙර වර්ෂයේ ආදායමින් සියයට 1 ක් වූ මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හෝටල් 02 ක් 2019 වර්ෂය වන විටත් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගෙන නොතිබූ බැවින් පෙර වර්ෂවලදී සියයට 1ක ආදායම ලබා ගැනීමක් සිදු නොකෙරුණි. මෙම වර්ෂය තුලදී පෙර වර්ෂයේ ආදායමෙන් සියයට 1ක බදු මුදලක් අය කිරීමටද කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන ඒ සඳහා වෙළඳ බලපත්‍ර ආදායම් රැස්කර ගත ගත යුතුවේ. |

**(ඇ)** වෙනත් ආදායම්

------------------

| | | |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලසීමාව තුළ ඉඩම් කට්ටි කිරීමේදී සභාවට පවරාගෙන තිබුණු රු.14,035,000 ක්වූ පර්චස් 1499 ක ඉඩම්වල එළදාව බදුදීමට හෝ කිසියම් ආදායමක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයෙන් අනතුරුව ඉදිරි වර්ෂයෙන් පසු එම දේපළ බදු දී ආදායම් රැස් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | කඩිනමින් අදාළ දේපළ බදුදී ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**(ඉ)** උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

| | | |
|---|---|---|
| 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල සීමාවට අදාළව හලාවත දිසා අධිකරණ බල ප්‍රදේශය වෙනුවෙන් සභාවට ලැබිය යුතු උසාවි දඩ රු.4,070,684ක් හා 2008 ජනවාරි සිට 2010 නොවැම්බර් මස දක්වා ලැබිය යුතු | මෙම රු.4,070,684ක උසාවි දඩ මුදල සම්බන්ධව තීරණ ගැනීමට 2020 දෙසැම්බර් 08 දින පැවති ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මහ සභා වාරයට යෝජනා අංක 05:04 යටතේ ඉහත සඳහන් මුදල | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු යාවත්කාලීනව අය කරවා ගැනීමට කටයුතු කළ |

| | |
|---|---|
| රු.10,479,783 ක මුද්දර ගාස්තු ආදායම සභාවට අහිමිවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | කපාහැරීම සුදුසු බව යෝජනා කර යුතුවේ. එහි උදෘතයක් සහ ලිපිවල ඡායාස්ථ පිටපත් පළාත් පාලන කොමසාරිස්(වයඹ) වෙත යොමු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරච්චිකට්ටුව පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පවත්වාගෙන යනු ලබන කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා රු.859,250ක වටිනාකමකින් යුත් කාය වර්ධන උපකරණ සවිකර තිබූ නමුත් ඒ මගින් සභාවට ආදායම් උපදවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පුහුණු උපදේශකවරයකු බඳවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලැබී අයදුම්පත් කැඳවූ අතර 2021 අගෝස්තු 20 වන දින රටේ පැවති වසංගත තත්ත්වය මත නිරෝධායන ඇඳිරි නීතිය ප්‍රකාශ කල නිසා එම දිනය 2021 ඔක්තෝබර් 29 දින දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරමි. | ආදායම් උත්පාදන කාර්යය සඳහා අදාළ වත්කම් නිවැරදිව කළමනාකරණය කළ යුතුවේ. |